# විශ්ලේෂී බටහිර දර්ශනය, භාරතීය භාෂා දර්ශනය හා පාලි සූත්‍රාගත බෞද්ධ භාෂා දර්ශනය

**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**[1]

බටහිර දර්ශන විෂයය නව මගකට යොමුකරලමින් බර්ට්‍රන්ඩ් රසල් විසින් විසි වන සියවසේ ආරම්භයේ දී දාර්ශනික රීතිය (Philosophical Method) නමින් නව දාර්ශනික චින්තන ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. එම රීතියේ පළමු පියවර අර්ථවත් කියමන් ගන්නා ආකෘතීන් (forms) විග්‍රහයට ලක් කිරීමයි. එහි දී විවිධ සප්‍රමාණ ආනුභවික ඥානයේ විවිධ ආකාර පිළිබඳ තාර්කික සම්බන්ධ සහ තාර්කික පදසටනාව (logical relation and logical syntax) එළිදරව් කෙරෙයි. දෙවැනි පියවර එම කියමන් සමර්ථනය (justification) කිරීමයි. රසල් තම රීතියෙන් අදහස් කළේ යථාර්ථය පිළිබඳ විවිධ කියමන් ස්වාභාවික භාෂාවෙන් (කථා කරන භාෂාවෙන්) ගෙනහැර පෑමෙන් ම ඥානයේ එළිදරව්වේ ප්‍රතික්ෂේප වීමකි. ස්වාභාවික භාෂා (natural language) උපයෝගි කරගෙන ඉදිරිපත් කෙරෙන සංකීර්ණ කියමන් ඒවායේ සරල කියමන්වලට යෑම රසල් පළමුව අගය කළත් පසුව ස්වාභාවික භාෂා යන්න වෙනුවට න - ස්වාභාවික භාෂා (non-natural language) යන්න යෙදීය. ඒ සඳහා පාරිභාෂික වචන මාලාවක (technical terminology) නිර්මාණය අවශ්‍ය විය. මෙය තර්කානුසාරී අණුවාදය (logical atomism) නමින් හඳුන්වනු ලැබීය. විශ්ලේෂී ස්වරූපයක් ගනිමින් මෙම භාෂාමය එළඹුම තවදුරටත් එල්. විට්ගන්ස්ටෛන් අතින් විස්තීර්ණ විය. ඒ වන විට පැතිර තිබූ ස්වාභාවික භාෂා සංකල්පය ඉවත් කර දර්ශන විෂයයට භාෂාවක් නිර්මාණය කරගැනීම ඔහුගේ මතය විය.

බටහිර විශ්ලේෂී දර්ශනයෙන් ඉදිරිපත්වන මෙම සංකල්ප භාරතීය හා බෞද්ධ භාෂා දර්ශනය සමග ගළපා බැලීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මුඛ්‍ය අරමුණයි.

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email:yatagama2@yahoo.com

භාරතීය භාෂා දර්ශනය බ්‍රාහ්මණ යුගයේ සිට ම විකසිත වූවකි. නිරුක්ති ශාස්ත්‍රඥ යාස්ක විසින් වාග්විද්‍යාව පිළිබඳ විද්වතුන් දෙපිරිසක් හඳුන්වා දී ඇත.

1. නෛරුක්තස් (භාෂාවේ වචනවල නිරුක්තිය පිළිබඳ විශාරදයින්)

2. වෛයාකරණඥස් (වියරණකරුවන් = ව්‍යාකරණඥයින්)

නිරුක්ති හෝ පදක යන්නෙන් අදහස් කෙරුනේ පදයක් විග්‍රහකර ඒවායේ මූලධාතූන්ට හෙවත් ඒවා තැනී ඇති අණුක අවයවවලට විශ්ලේෂණය කිරීමයි. ව්‍යාකරණ යන්නෙන් අර්ථවත් කෙරුණේ භාෂාවේ එන විවිධ පදයන් අතර සම්බන්ධතාව නිර්දේශ කිරීමයි. බට්‍රන්ඩ් රසල් දාර්ශනික රීතිය යටතේ හඳුන්වා දී ඇත්තේ ද මෙම සංකල්ප දෙක ම බව කිව හැකිය. එනම් අර්ථවත් කියමන් ගන්නා ආකෘතීන් විග්‍රහයට ලක් කිරීම හා එම කියමන් සමර්ථනය කිරීමයි.

පාලි සූත්‍රාගත භාෂා දර්ශනය මෙම බටහිර විශ්ලේෂී දර්ශනයටත් පැරණි භාරතීය භාෂා දර්ශනයටත් වඩා වෙනස් වූවකි. පැරණි භාරතීය භාෂා චින්තන සම්ප්‍රදාය ගැන දැනසිටි බුදුරදුන් අතින් භාරතීය භාෂා දර්ශනය නියෝජනය කළ නිරුක්තිය හෝ ව්‍යාකරණය ප්‍රතික්ෂේප වී නොමැති බව පළමුව කිව යුතුය. එහෙත් නිරුක්තිය හරහා භාරතීය භාෂා චින්තනය විසින් ප්‍රකට කළ අන්තවාදීත්වය බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එම නිසා පාලි සූත්‍රාගත භාෂාවේ ඇති විශේෂත්වය නම් එම නිරුක්ති හා ව්‍යාකරණ යන භාරතීය භාෂා චින්තන සම්ප්‍රදා අභිබවා සංවර්ධනයට පත්වීමයි.

රසල් මෙන්ම විට්ගන්ස්ටෛන් ද දර්ශන විෂයයට භාෂාවක් නිර්මාණය කිරීම ඉතා ඉහළින් සාකච්ඡා කර ඇති බව ඉහත දැක්විණ. පාලි සූත්‍රවලදී අපට හමුවන භාෂාවෙහි බෞද්ධ දර්ශනය සඳහා ම නිර්මාණය වූ පාරිභාෂික වචන මාලාවක් දැකගත හැකි බව මෙහි ලා සඳහන් කළ යුතුය.

ප්‍රමුඛ පද: බටහිර දර්ශනය, භාරතීය භාෂා දර්ශනය, පාලි සූත්‍ර

**Title:** Analytical Western Philosophy, Indian Language Philosophy and Buddhist Language Philosophy of Pali Sutras

**Keywords:** Western Philosophy, Indian Language Philosophy, Pali Sutta